# ඉඩම් හා සංවාරක අමාත්‍යාංශය

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## ලංසු ආරාධනයයි

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් ආයතන තුල වැඩ, සේවා හා භාණ්ඩ මිලදී ගැනීම් සඳහා ඒ සඳහා ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී ඇති සුදුසුකම් ලත් ආයතන වලින් මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

| අනු අංකය | කොන්ත්‍රාත්තුවේ නම | සුදුසුකම් | ලංසු ආරක්ෂණ | | ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තුව (රු) |
|---|---|---|---|---|---|
| | | | මුදලින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තැම්පත් කරන්නේ නම් (රු) | බැංකු ඇපකරයක් ලෙස ලබා දෙන්නේ නම් (රු) | |
| වැඩ | | | | | |
| 1 | මිරිජ්ජවල වියළි කලාප උද්භිද උද්‍යානයේ චේන් ලින්ක් වැට වැඩිදියුණු කිරීම (මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි. 5.8) | ගොඩනැගිලි C8 හෝ ඉහළ | 29,000.00 | 58,000.00 | 3,000.00 |
| 2 | ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ ජල ටැංකිය සඳහා ආධාරක කුළුණු සවිකිරීම (මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි. 7.65) | ගොඩනැගිලි C8 හෝ ඉහළ | 39,000.00 | 78,000.00 | 3,000.00 |
| 3 | ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ අභ්‍යන්තර නව ජල සැපයුම් පද්ධතියක් ස්ථාපනය කිරීම (මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි. 8.0) | ජල සම්පාදන හා ජලාපවාහන C8 හෝ ඉහළ | 40,000.00 | 80,000.00 | 3,000.00 |
| 4 | ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම (මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි. 4.85) | ගොඩනැගිලි C9 හෝ ඉහළ | 24,250.00 | 48,500.00 | 3,000.00 |

**02.** ලංසු ආකෘති කොන්දේසි හා අනෙකුත් විස්තර පේරාදෙණියේ පිහිටි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙන් **2023.05.15** වන දින සිට **2023.06.06** වන දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව **9.00** සිට ප.ව **3.00** දක්වා ආපසු නොගෙවන ඉහත වගුවේ සඳහන් ලංසු ලියවිලි ගාස්තු ගෙවා ලබා ගත හැකිය. එසේ නැතහොත් **https://www.botanicgardens.gov.lk/bid-invitation** දරණ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන්ද ලංසු ලේඛණ බාගත කර ගැනිමට පහසුකම් සලසා ඇත.

සැලකිය යුතුයි :- එසේ වෙබ් අඩවිය මගින් ලංසු ලේඛණ බාගත කර ඉදිරිපත් කරන්නේ නම් ලංසු ලේඛණ පිටපත් 2ක් මුල් පිටපත හා අනු පිටපත ලෙස නාමකරණය කර ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

**03.** ලංසු කොන්දේසි පිළිබඳව හොඳින් අධ්‍යනය කර නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආකෘති පිටපත් දෙකකින් යුක්තව (මුල් පිටපත හා අනු පිටපත) **2023.06.07** වන දින පෙ.ව.**11.00** ට පෙර ලියාපදිංචි තැපැලෙන් සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ.පෙ.**14**, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුවේ. එසේ නැතිනම් ලංසුපත් අතින් ගෙනවිත් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ලංසුපත් බහාලන පෙට්ටියට බහාලිය යුතුය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ලංසුපත් බහා එවන කවර විවෘත කළ හැකි ස්ථාන සීල් තබා එවිය යුතු අතර, එම කවරයේ වම්පස ඉහල කෙලවරේ අදාල කොන්ත්‍රාත්තුවේ නම සඳහන් කල යුතුය. **2023.06.07** වන දින පෙ.ව.**11.00** ට ලංසුපත් භාරගෙන අවසන්වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ.

05. ලංසු ආරක්ෂණය ඉහත සඳහන් පරිදි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ හැකි අතර එසේ නොමැති නම් ලංසුපත් සමඟ ඉහතින් දක්වා ඇති මුල්‍ය වටිනාකමකින් යුත් ලංසු ආරක්ෂණ බැඳුම්කරයක් රජයේ පිළිගත් වාණිජ බැංකුවක් මඟින් අධ්‍යක්ෂ ජනරාල් - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් ලංසුපත් විවෘත කරන දින සිට ඉදිරියට දින **90** කට වලංගු වන පරිදි ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ඇප බැඳුම්කර ඉදිරිපත් කර නොමැති ලංසුපත් සලකා බැලීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සඳහා බැංකු මඟින් නිකුත් කරන චෙක්පත් හා බැංකු ගෙවීම් අණකර භාරගනු නොලැබේ.

06. ලංසුපත් පිළිබඳ තීරණ ගැනීමේ සම්පූර්ණ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, මෙම නිවේදනයේ හෝ ලංසු ආකෘතින්හි සඳහන් හෝ සඳහන් නොවන මෙම ප්‍රසම්පාදන කාර්යයට අදාල කිසියම් කාරණයක් පිළිබඳ තීරණයක් ලබාදීමේ බලය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ. මේ පිළිබඳ වැඩිමනක් විස්තර දුරකථන අංක **081-2388654** මඟින් ප්‍රධාන ගණකාධිකාරි අමතා ලබාගත හැකිය.

07. මේ සම්බන්ධව පූර්ව ලංසු රැස්වීම **2023.05.26** වන දින පෙ.ව**11.30** ට ජාතික උද්භිද උද්‍යානයේ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට නියමිතය.

සභාපති.

දෙපාර්තමේන්තු මහ පරිමාණ ප්‍රසම්පාදන කමිටුව,

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,

පේරාදෙණිය.

**2023.05.15**